# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### 2023 අධ්‍යයන වර්ෂයට උපාධි පාඨමාලා (බාහිර) සඳහා ලියාපදිංචි කිරීම

පහත සඳහන් උපාධි පාඨමාලා සඳහා 2023 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචිවීමට අයදුම්පත් ගාස්තු ලෙස රු.1000/- මුදලක් ගෙවා නිසි පරිදි අයදුම් කරන ලද සිසුන්ගෙන් තෝරාගත් ශිෂ්‍ය නාම ලේඛනය අපගේ වෙබ් අඩවියේ (www.cdce.kln.ac.lk) මේ වනවිට පළකර ඇත.

| පාඨමාලාව | පාඨමාලා ගාස්තුව (මෙය වාරික 05කින් ගෙවීම් කළ හැකිය) | ලියාපදිංචි කරගැනීම සඳහා වන පළමු වාරිකය | අධ්‍යයන වර්ෂය ආරම්භ වන දිනය |
|---|---|---|---|
| **ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව** | රු. 86,000.00 | රු. 15,000.00 | **ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ** |
| **ව්‍යාපාර කළමනාකරණවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව** | රු. 120,000.00 | රු. 25,000.00 | |
| **වාණිජ විද්‍යාවේදී විශේෂ (බාහිර) උපාධි පාඨමාලාව** | රු. 162,500.00 | රු. 44,000.00 | |
| **විද්‍යාවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව** | රු. 300,000.00 | රු. 100,000.00 | |

ලියාපදිංචිවීම සඳහා පළමු වාරිකය ගෙවිය යුතු අතර ඒ සඳහා ඔබ විසින් පහත සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය.

1. මුලින්ම අපගේ වෙබ් අඩවියට පිවිස එහි **"New Registration"** නැමති අයිතමය තෝරාගන්න.

2. ඉන්පසු ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් අනතුරුව ඔබගේ පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් උඩුගත (Upload) කරන්න. පසුව ඔබගේ අයදුම්පත් අංකය ඇතුළත් කර අදාළ අයදුම්පත බාගත කරගන්න.

3. එවිට ඔබට හිමි වවුචර්පත, ප්‍රකාශන පත්‍රය සහ නම, ලිපිනය, අදාළ පාඨමාලාව සඳහන් පත්‍රිකාව මෙන්ම වාරික ගෙවීම් පිළිබඳ විස්තර පත්‍රිකාව දිස්වනු ඇත. එම පත්‍රිකාවේ සඳහන් තොරතුරු නිවැරදි බව ඔබ විසින් තහවුරු කිරීමෙන් පසු අදාළ ලේඛන ඔබ විසින් මුද්‍රණය කර ගත යුතුය.

4. අනතුරුව වවුචරයේ සඳහන් උපදෙස් අනුව එහි සඳහන් මුදල වවුචරයේ සඳහන් **ගිණුම් අංකයට පමණක්** ගෙවිය යුතුය.

5. පළමු වාරික මුදල මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට 2024.01.31 දිනට පෙර ගෙවිය යුතුය. **(කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ගිණුමට බැර කරනු ලබන කිසිඳු මුදලක් ආපසු ගෙවනු නොලැබේ.)**

6. මෙම දිනට හෝ ඊට පෙර ගෙවීම් නොකරන අපේක්ෂකයින් ලියාපදිංචිය සඳහා සලකා බලනු නොලැබේ.

7. මුදල් ගෙවීමෙන් පසුව බැංකුව විසින් ඔබ වෙත ලබාදෙනු ලබන කහ පැහැති පාරිභෝගික පිටපත සමග නිසි පරිදි අත්සන සහතික කරන ලද ප්‍රකාශන පත්‍රය, නිරවද්‍යතාවය තහවුරු කරන ලද තොරතුරු අඩංගු පත්‍රිකාව, පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූප 02ක් සහ පහත ලේඛනවල සහතික කළ ඡායා පිටපත් අනිවාර්යයෙන් එවිය යුතුයි.
   - **උප්පැන්න සහතිකය**
   - **ජාතික හැඳුනුම්පතේ පිටපතක්**
   - **අ.පො.ස (උ.පෙළ) සහතික**
   - **වෙනත් සුදුසුකම් යටතේ ලියාපදිංචි වන්නේ නම් එම සහතික**
   - **පූජ්‍ය පක්ෂය සඳහා සාමණේර හෝ උපසම්පදා සහතිකය.**

**තව ද උප්පැන්න සහතිකයේ සඳහන් නම සහ අධ්‍යාපන සහතිකවල සඳහන් නම අතර වෙනසක් පවතින්නේ නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.**

**<u>ප්‍රකාශන පත්‍රයේ අත්සන සහ ලේඛනවල ඡායා පිටපත් සහතික කිරීම</u>**

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / ප්‍රදේශයේ ග්‍රාම සේවා නිලධාරි / සාමදාන විනිශ්චයකාරවරයෙකු / නීතිඥවරයෙකු හෝ ඉහත තනතුරු දරණ රජයේ පිළිගත් ආයතනයක මාණ්ඩලික නිලධාරියෙකු විසින් සිදුකළ යුතුය.

9. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"Registration - 2023"** ලෙස සඳහන් කර **2024.02.15** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකළ යුතුය.

   **ලිපිනය :-** **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,**<br>
   **දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,**<br>
   **තැ.පෙ. 03,**<br>
   **කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.**

10. ඔබ ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වන්නේනම් ඔබට ලබා දී ඇති විෂයයන් සඳහා බාහිර උපාධි අපේක්ෂකයින් අවම වශයෙන් 20 දෙනෙකවත් ලියාපදිංචි නොවුනහොත් ඔබට ලබා දිය හැකි වෙනත් විෂයයක් සඳහා ලියාපදිංචිවීමට සිදු වන බව දන්වමි.

**ඔබ ලබා දී ඇති තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත් වුවහොත් ඔබගේ ලියාපදිංචිය අවලංගු කරන බව දන්වන අතර ගෙවා ඇති කිසිඳු මුදලක් ආපසු නොගෙවන බව ද වැඩිදුරටත් දන්වමි.**

**මෙම අධ්‍යයන වර්ෂය සඳහා සීමිත සිසුන් පිරිසක් පමණක් බඳවා ගන්නා බැවින් පළමු වාරික මුදල් ගෙවන අනුපිළිවෙල අනුව ලියාපදිංචි කිරීම සිදුකරනු ලැබේ.**

2023 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචිවීම සඳහා අයදුම්කර එහෙත් අයදුම්පත් ගාස්තු ලෙස රු. 1000/- මුදල නොගෙවූ සිසුන්, එම මුදල ගෙවා අදාළ රිසිට්පත cdce@kln.ac.lk යන විද්‍යුත් ලිපිනයට අයදුම්පත් අංකය සමග 2024.01.16 දිනට පෙර යොමුකරන ලෙස දන්වන අතර ඔවුන් ඉදිරියේ දී ලියාපදිංචිය සඳහා තෝරාගැනීම පිළිබඳව සලකා බලනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි,<br>
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය.<br>
කැලණිය විශ්වවිද්‍යාලය<br>
2024.01.02